# කකුල් හතරේ හා කකුල් දෙකේ මීහරක්

පසුගිය සතියේ තෙලට විරුද්ධව ගොන් කරත්තවල ගිය නෝනාවරු මහත්වරු මේ සතියේ වාහන නවතා නලා ශබ්ද කිරීමට පටන්ගත්හ. පාරේ යන එන වාහනවලින් නැගෙන ශබ්දය හේතුවෙන් එ ජා ප රිය කිහිපයේ නලා හඬ එතරම් හොඳින් ඇසී නැත. විකල්ප වැඩ පිළිවෙලක් ඉදිරිපත් නොකර තෙල් ප්‍රශ්නයට ගොනුන් පසු පස යෑම මගින් සනිටුහන් වූයේ එ ජා ප නායකයන් ක්‍රියා කරන්නේ බටහිරයන්ගේ උපදෙස් මත බව ය. ඩී. එස්. සේනානායක මහතා ද දේශපාලනය කෙළේ බටහිර න්‍යාය පත්‍රයකට අනුව ය, එසේ වුවත් ඒ මහතාට මෙරට ප්‍රශ්න ගැන අවබෝධයක් විය. රජරට හා නැගෙනහිර පළාතේ ඒ මහතා ඇතිකළ ජනපද නොවන්නට අද වන විට සිංහලයන්ට අසීරු තත්වයකට මුහුණ දීමට සිදු වීමට තිබුණි. එදා සේනානායක මහතාගේ බ්‍රිතාන්‍ය ගැති ප්‍රතිපත්ති මධ්‍යයෙහි වුව ද ජනතාව ඒ මහතා වටා රොක්වූයේ යම් ජාතිකත්වයක් එතුමාගෙන් පිළිබිඹු වීම නිසා ය. ලංකා සමසමාජ පක්ෂය හා පසුව කොමියුනිස්ට් පක්ෂය (මේ නමේ ම කිසිම ජාතිකත්වයක් නැත) කෙතරම් අධිරාජ්‍ය විරෝධී වුව ද ඒ පක්ෂවලට ජනතාව ආකර්ෂණය නොවූයේ එහි ජාතිකත්වයක් නොවීම හේතුවෙනි. අද පවා එ ජා පක්ෂයට ඡන්දය දෙන්නන්ගෙන් වැඩි දෙනකු ජාතිකත්වය මත ඒ පක්ෂය වටා ඒකරාශී වුවන්නේ පැවත එන්නන් යැයි කීම අතිශෝක්තියක් නො වෙයි.

අද ක්‍රමයෙන් ජනතාව එ ජා පක්ෂයෙන් ඉවත් වී යන්නේ ඒ පක්ෂය ද සමසමාජ කොමියුනිස්ට් පක්ෂ මෙන් ම ජාතිකත්වයෙන් ඈත්වෙන බැවිනි. ලංකාවේ වාහනවල නලා ශබ්ද කිරීමෙන් විරෝධය පෑමේ සම්ප්‍රදායක් නැත. එමෙන් ම හට්ටි මුට්ටි පොළොවේ ගැසීම ද මෙරටට උචිත දෙයක් නො වෙයි. විශේෂයෙන් ම සිංහල අවුරුද්ද දිනවල හට්ටි පොළොවේ ගැසීම සිංහල සංස්කෘතිය ම හෑල්ලුවට ලක්කිරීමකි.  එ ජා ප නෝනා මහත්මීන් කරත්ත දැක්කීම ද සිංහලයන්ට අළුත් ම අත්දැකීමක් විය. සාමාන්‍යයෙහි සිංහල ස්ත්‍රීහු කරත්ත නො දක්වති. ඒ ඊනියා පුරුෂාධිපත්‍යයක් හේතුකොටගෙන නොව කරත්තයට නැඟීම, කරත්තයෙන් බැසීම , ගොනා හැසිරවීම ආදී කරුණු හේතුකොටගෙන ය. අද මේ නෝනා මහත්මීන් කරත්තයෙන් බැසීමේ දී බෝං ලීයට යටින් රිංගීමෙන් ගොනාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ද ද ප්‍රශ්න ඇති වී තිබේ. රාජ්‍ය නොවන සංවිධානවල ඊනියා මානව අයිතිවාසිකම් වෙනුවෙන් කෑ කෝ ගසන්නන්ට දැන් ගොන් අයිතිවාසිකම් ගැන ද කතා කළ හැකි ය.

මෙරට ජනාධිපතිවරුන් හා අගමැතිවරුන් වශයෙන් සේවයකළ හා සේවය කරන අය ගැන සලකා බැලීමේ දී පෙනී යන කරුණක් නම් බටහිර අධ්‍යාපනය විසින් එතරම් මනස සකස් නොකෙරුණු හෝ සකස්කෙරීමට ඉඩ නොලැබුණු හෝ කිහිප දෙනා අනෙක් අයට වඩා රටට වැඩක්කර ඇති බව ය. එයට ප්‍රධාන හේතුව බටහිර අධ්‍යාපනයට ඔවුන් රට ගැන තිබූ දැනුම නැතිකිරීමට නො හැකිවීම ය. බටහිර අධ්‍යාපනයෙන් දැනුම ලැබූ දේශපාලනඥයෝ හා උගත්තු බටහිර ප්‍රවාද හා සංකල්පවලට අනුව ඒ ආකල්ප මත පදනම් වී රට කරගෙන යෑමට උත්සුක වූහ. වී ගොවිතැන පිළිබඳ ව ගොවියන්ගෙන් ඉගෙනගනු වෙනුවට මේ දේශපාලනඥයෝ හා උගත්තු බටහිර ඊනියා කෘෂි විශේෂඥයන්ගෙන් හා ආර්ථික විද්‍යාඥයන්ගෙන් ඉගෙන ගත්හ. අපේ උගත්තු වී ගොවිතැන ගැන ඊනියා පර්යේෂණ කිරීමට පිලිපීනයේ ඊරී නමින් හැඳින්වෙන ජාත්‍යන්තර සහල් පර්යේෂණාගාරයට ගියහ.

මේ අතර බටහිර සමාගම් මෙරට ගොවියන්ට රට පොහොර හඳුන්වා දුනි. මුල දී මේ සමාගම් ගොවියන් අතර ඒ නොමිළේ බෙදා දුනි. ක්‍රමයෙන් ගොවීහු රට පොහොරවලට පුරුදු වූහ. ඒ අතර රට පොහොර යොදා වගාකළ හැකි වී වර්ග මෙරටට හඳුන්වා දෙන ලදී. මේ සියල්ල කෙරුණේ බටහිර දැනුමේ විශේෂයෙන් ම බටහිර කෘෂිකර්මයේ හා බටහිර ආර්ථික විද්‍යාවේ අනුහසිනි. සියල්ල හමාරවීමෙන් පසුව අද බටහිරයෝ හා ඔවුන් පසුපස යන ඊනියා උගත්තු විලාසිතාවකට මෙන් ඊනියා කාබනික පොහොර ගැන දොඩවති. පැරණි ගොවියන්ගේ විද්‍යාව (විද්‍යා ඇත්තේ බටහිරයන්ට පමණක් නොවන බව මෙරට උගතුන් යැයි කියාගන්නා විභාග සමතුන් ඉගෙන ගත යුතු පාඩමකි.) කුමක් දැයි හදාරා අවශ්‍ය නම් ඒ වර්ධනය කරගන්නේ කෙසේ දැයි සොයා බලනු වෙනුවට බටහිරයන්ගේ දැනුම පිටුපස යෑමේ විපාකය දැන් අපට අත්විඳීමට සිදු වී ඇත. අද ඊරී ආයතනය පිහිටා ඇති පිලිපීනයේ ද සහල් අර්බුදයකි. මුළු ආසියාවට ම සහල් ගැන ඉගැන්වීමට බටහිරයන්ගේ ආධාරයෙන් ඊරී ආයතනය පිහිටු වූ ඇමරිකන් යටත්විජිතයක් වැනි පිලිපීනයේ තත්වය ද එබඳු නම් ලංකාව මේ අර්බුදයෙන් මෙතරම් හෝ ගැලවී සිටීම ගැන අප සතුටු විය යුතු ය. එහෙත් එසේ ගැලවී ඇත්තේ මෙරට උගතුන් නිසා නම් නො වේ.

© Prof. Nalin De Silva

මෙරටින් මීහරකුන් නැතිකළ යුතු බවට එක්තරා බටහිරයකු කියා ඇති බව මගේ මතකය වෙයි. මීහරක් යොදා නගුලෙන් සී සානු වෙනුවට ට්‍රැක්ටරයෙන් සී සෑම හා අනෙක් කාර්යයන් කළ යුතු බව ඔහුගේ අදහස වී ඇත. මේ ඊනියා දියුණු ක්‍රමයෙන් ලංකාවට වී ඇති සෙත කුමක් ද? අද කකුල් හතරේ මීහරකුන් සම්පූර්ණයෙන් කෙසේ වෙතත් විශාල වශයෙන් නැති වී කකුල් දෙකේ මිහරකුන් සෑහෙන ප්‍රමාණයක් බිහි වී ඇත. කකුල් දෙකේ සතාට මිස කකුල් හතරේ සතාට උගතා යැයි නො කියැවෙයි. ට්‍රැක්ටරයට, රට පොහොරට, රට වී වර්ගවල බීජවලට, ආදී සියල්ලට මුදල් අවශ්‍ය වෙයි. රුපියල් නොව විවිධ වර්ගවල ඩොලර් අවශ්‍ය වෙයි. වී ගොවිතැනෙන් පාඩු විඳින්නේ එයට යන වියදම ද වැඩි වී ඇති නිසා ය. අද කවුරුත් දන්නා බොර තෙල් බැරලයක මිල වැඩිවන විට මේ වියදම ද තව තවත් වැඩි වෙයි. අතරමැදියන්ගේ ප්‍රශ්නය, වී ගබඩාකිරීමේ ප්‍රශ්නය ආදිය ද වී ගොවිතැනේ ප්‍රශ්නයට එකතු වෙයි. දැනට අවුරුදු විස්සකට පමණ පෙර ද දිවයින පුවත්පතෙහි මේ කරුණු සාකච්ඡා විය. එදා ඒවාට ඇහුම් දුන්නෝ ඉතා සීමිත පිරිසක් වූහ. අද එදාට වඩා මේ ප්‍රශ්න ගැන අවදියෙන් සිටින්නෝ වෙති. එහෙත් තත්වය තවමත් සතුටුදායක නො වේ. බොහෝ දෙනාට අද ද බටහිර දැනුම, විශේෂයෙන් ම බටහිර විද්‍යාව මහෞෂධයකි. ඒ ඔවුන්ට කියා දී ඇති ආකාරයට එකම දැනුම වෙයි. ඒ ඊනියා වාස්තවික යථාර්ථවාදී දැනුමකි. බටහිරයන් අප පාලනය කරන්නේ මේ වාස්තවික කඩතුරාවට මුවාවෙමිනි. වාස්තවිකත්වය නම් පට්ටපල් බොරුව බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් අප පාලනය කිරීම සඳහා නිපදවනු ලැබ ඇති අවියක් පමණකි.

අදවත් පැරණි ගොවිතැන් ක්‍රම ගැන අධ්‍යයනයක් කිරීමට හා ඒ වර්ධනයකිරීමට අප උත්සාහගත යුතු ය. වර්ධනයකිරීම යන්නෙන් අදහස්කරන්නේ ශිෂ්‍යත්වයක් ලැබ පිටරට ගොස් සුද්දන්ගෙන් යමක් ඉගෙන මෙහි පැමිණ එය ගොවියන්ට බලහත්කාරයෙන් හෝ වෙනත් ආකාරයකට හෝ ලබාදීම නො වේ. ඛණිජ තෙල් නැතිව වී ගොවිතැන කරන්නේ කෙසේ ද යන්න අදවත් ඉගෙන ගත යුතු ය. කකුල් දෙකේ මිහරකුන් වෙනුවට කකුල් හතරේ මිහරකුන් ඇතිකර ගැනීමට වෙහෙස විය යුතු ය. කකුල් දෙකේ මිහරකුන් දෙදෙනකු කකුල් හතරේ මීහරකුකට සමාන නැති බව දැනගැනීමට  පිටරට යෑමට අවශ්‍යවන්නේ කකුල් දෙකේ මිහරකකුට පමණකි. කකුල් හතරේ මිහරකුකවත් එ ජා ප නෝනා මහත්වරුන් විසින් දක්කන ලද ගොනකුවත් එවැනි ඉල්ලීමක් නොකරනු ඇත. යම් අයුරකින් කකුල් දෙකේ මීහරකුන් දෙදෙනකු කකුල් හතරේ මීහරකකුට සමාන වීනම් බටහිර දැනුමෙන් කකුල් කෙසේ වෙතත් ඔළුව උදුම්මාගත් කකුල් දෙකේ මීහරකුන් කුඹුරට බස්සවා මිහරක් ප්‍රශ්නය විසඳාගැනීමට තිබුණි. අතරමැදියන්ගේ ප්‍රශ්නය බටහිර ක්‍රමයේ ආර්ථික ව්‍යුහයක් නිසා ඇතිවන්නකි. ඒ ආර්ථික ව්‍යුහය වෙනස්කිරීම වැදගත් වෙයි. වී ගබඩාකිරීම සඳහා වී බිස්ස වර්ධනය කරගැනීමට අප උනන්දු විය යුතු ය.

එහෙත් ඒ සියල්ලට වඩා අපේ ආකල්ප හා කෙටියෙන් කියන්නේ නම් චින්තනය වෙනස්කර ගත යුතු ය. (ආකල්ප ද චින්තනයේ කොටසක් බව මගේ ලෝකය කෘතිය කියවීමෙන් දැනගත හැකි ය.)  පළමුවෙන් ම දැනගත යුතු කරුණ නම් බටහිරයන්ගේ දැනුම ද තවත් එක් දැනුමක් මිස ඊනියා ලෝක දැනුමක් නොවන බව ය. අද අප රැවටීම සඳහා බටහිරයෝ විවිධ දෑ කරති. ඔවුහු මෙරට තම අතවැසි උගතුන් පිරිසක් ලවා තම අවශ්‍යතා ඉටුකර ගනිති. එකල තිබූ විශ්වවිද්‍යාල ප්‍රවේශ පරීක්ෂණයෙන් රසායන විද්‍යාව මෙන් ම භෞතික විද්‍යාව ද අසමත් ව වෛද්‍ය පීඨයට තේජී මහාචාර්යවරයකු වූ අයකු ඇතුළු ව්‍යාජ උගත්තු මෙරට අද දැනුම් ආධිපත්‍යය දරති. අවුරුදු පනහකට පසුවත් ඔහු භෞතිකවිද්‍යාවේ දන්නා ඉටිගෙඩියක් නැත. එහෙත් ඔහු හුදී ජනයාට ක්වොන්ටම් භෞතික විද්‍යාව හා සාපේක්ෂතාවාදය උගන්වයි. ඔවුන්ට ඇත්තේ බටහිර දැනුමේ අනුහස පමණකි. ඔවුන් විසින් බටහිර බෙහෙතක් සඳහාවත් සංකල්පයක් ප්‍රවාදයක් නිර්මාණය කෙරී නැත. ඔවුන් දන්නේ එකිනෙකාගේ පිටකසා ගනිමින් ජනතාව රවටමින් වැජඹීම පමණ ය. කලාකරුවන් නමින් හැඳින්වෙන්නෝ ද මේ පිරිස අතර වෙති. බටහිර දැනුම එකම ලෝක දැනුම බව පෙන්වීම සඳහා බටහිරයෝ අපේ දැනුමට සාම්ප්‍රදායික දැනුම දේශීය දැනුම ආදී වචන යොදා ගනිති. මේ එක්  යෙදුමක්වත් අපේ යහපත සඳහා නො වේ. අපේ දැනුම සම්ප්‍රදායික දැනුමක් හෝ දේශීය දැනුමක් හෝ යැයි කී විට ඒ දැනුම කාලයෙන් හා අවකාශයෙන් සීමා වෙයි. එහෙත් බටහිර දැනුම සෑම කලකට ම හා දේශයකට ම පොදු ඊනියා වාස්තවික දැනුමක් ලෙස ඉගැන්වෙයි. නැත, බටහිර දැනුම ද තවත් එක් දැනුමක් පමණ ය. බටහිර දැනුම යනු බටහිර දේශීය දැනුම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva